# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1773/28 – 2012 අගෝස්තු 29 වැනි බදාදා – 2012.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 202 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/3/2011/ඩබ්එස්/72.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ප්‍රාලේ/අක්/5/1/393(vi).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 අගෝස්තු මස 23 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, අක්මීමණ.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහලගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/AKM/11/686 හා 2011.12.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0049ක් පමණ වන උඩඅමුනේවත්ත නොහොත් අමුණුදොරවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – උඩඅමුනේවත්ත නොහොත් අමුණුදොරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0049 ක් පමණ**

උතුරට: මාදොල සහ කේ. ජී. දයාවතී, හිමිකම් කියන උඩඅමුනේවත්ත නොහොත් අමුණුදොරවත්ත; නැගෙනහිරට: කේ. ජී. දයාවතී, හිමිකම් කියන උඩඅමුනේවත්ත නොහොත් අමුණුදොරවත්ත; දකුණට: කේ. ජී. දයාවතී, හිමිකම් කියන උඩඅමුනේවත්ත නොහොත් අමුණුදොරවත්ත සහ අක්මීමණ පින්නදූව ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: අක්මීමණ පින්නදූව ප්‍රාදේශීය සභා මාර්ගය සහ මාදොල.

09 - 381

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 203 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/5/2008/OCHW/244.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: අත්/කේඩී/82/එච්ඩබ්ලිව්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද

වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 අගෝස්තු මස 23 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6 "මිහිකත මැදුර",
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කඩුවෙල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරලේ සුළු කොට්ඨාසයේ, හේවාගම ගමේ පිහිටි සර්වේයර්ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KDW/2009/643 හා 2010.04.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0097ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබැලිවලට මායිම්:

01. **කැබලි අංක 01 – කැකිරිදෙනියවෙල – ප්‍රමාණය: හෙක්. 0.0029 පමණ**

උතුරට: පී. නන්දසිරි පෙරේරා සහ කේ. ඩී. විජේවර්ධන හිමිකම් කියන කැකිරිදෙනියවෙල; නැගෙනහිරට: කේ. ඩී. විජේවර්ධන සහ එන්. කරුණාවතී හිමිකම් කියන කැකිරිදෙනියවෙල; දකුණට: පීපී කො 8787 හි කැබලි අංක 63 සහ 62; බටහිරට: පීපී කො 8787 හි කැබලි අංක 59 සහ පී. නන්දසිරි පෙරේරා හිමිකම් කියන කැකිරිදෙනියවෙල.

02. **කැබලි අංක 02 – කැකිරිදෙනියවෙල – ප්‍රමාණය: හෙක්. 0.0068 පමණ**

උතුරට: පී. නන්දසිරි පෙරේරා හිමිකම් කියන කැකිරිදෙනියවෙල සහ පීපී කො 8787 හි කැබලි අංක 60, 61; නැගෙනහිරට: පීපී කො 8787 හි කැබලි අංක 61 සහ 64; දකුණට: අයිතිකරුගේ නම නොදන්නා කැකිරිදෙනියවෙල; බටහිරට: අයිතිකරුගේ නම නොදන්නා කැකිරිදෙනියවෙල සහ පී. නන්දසිරි පෙරේරා හිමිකම් කියන කැකිරිදෙනියවෙල.

09 - 382

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2012 අංක 204 දරන ආඥාව

මගේ යොමු අංකය: 4/3/4/2011/ඩී/187.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/කටා/ඉඅත්/77.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 අගෝස්තු මස 23 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කටාන.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දූනගහ සුළු කොට්ඨාසයේ, උතුරු කඳිරාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/කටා/2012/256 සහ 2012.07.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8139ක් පමණ වූ කැබලි අක්ෂර ඒ, ඉඹුල්ගස්වාඩියවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඉඹුල්ගස්වාඩිය – ප්‍රමාණය: හෙක්. 0.8139ක් පමණ**

උතුරට: රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හිමිකම් තියන ඉඹුල්ගස්වාඩියවත්ත; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: කටාන විවිධ සේවා සමූපකාර සමිතිය හිමිකම් කියන ඉඹුල්ගස්වාඩියවත්ත; බටහිරට: බේස්ලයින් පාර.

09 - 383

---

ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2012 අංක 246 දරන ආඥාව

යොමු අංකය: එල්ඩී/05/2009/එම්වී/74ඒ.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 11/3/3/1/17සී.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයට යටත්ව අංක 1752/8 හා 2012.04.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2ඒ පිටුවේ පළ කරන ලද 2012 අංක 77 දරන ආඥාවේ ඉඩමේ විස්තරය යටතේ පහත සඳහන් ඉඩම් කොටසද ඇතුළත්ව ඉහත සඳහන් ආඥාව සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 අගෝස්තු මස 23 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

01. **කැබලි අක්ෂර ආර් – මඩුමාන – ප්‍රමාණය: හෙක්. 0.1301ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර එන් සහ පී; නැගෙනහිරට: කැබලි අක්ෂර පී, කියු සහ එක්ස්; දකුණට: කැබලි අක්ෂර ඩබ්ලිව්; බටහිරට: කැබලි අක්ෂර වී සහ එස්.

09 - 384

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2006 මැයි මස 25 වැනි දින අංක 1446/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2006 අංක 173 දරන ආඥාවේ කැබලි අක්ෂර ඒ සිට ඩී දක්වා ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/පීආර්ඩී/161.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: අත්/කේඑල්/45.
2012 අගෝස්තු මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, "මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටුවිල සහ කිට්ටන්පහුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පීපී කො. 8814 හා 2006.09.18 වැනි දින දරන මූලික පිඹුරේ කැබලි අංක 01, 02 සහ 06 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.1357 ක් පමණ වූ අම්පිට්ටනිය, කොම්පන්ජිරවෙල සහ අඹගහ වත්ත නමැති පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් සහ මායිම්වලින් යුක්ත වූ ඉඩම් කොටස් තුන:

01. **කැබලි අංක 01 – අම්පිට්ටනිය, කොම්පන්ජිරවෙල සහ අඹගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1269ක් පමණ**
උතුරට: ඒ. රාජපක්ෂ සහ තවත් අය හිමිකම් කියන අම්පිට්ටනිය, පීපී කො. 479හි කැබලි අංක 09 සහ පීපී. කො. 6276 හි කැබලි අංක 10; නැගෙනහිරට: පීපී කො. 6276 හි කැබලි අංක 10; දකුණට: පීපී කො. 6276 හි කැබලි අංක 10, රණවීර මාවත, ඒ. රාජපක්ෂ සහ තවත් අය හිමිකම් කියන අම්පිට්ටනිය; බටහිරට: ඒ. රාජපක්ෂ සහ තවත් අය හිමිකම් කියන අම්පිට්ටනිය.

02. **කැබලි අංක 02 – අම්පිට්ටනිය, කොම්පන්ජිරවෙල සහ අඹගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.9015ක් පමණ**
උතුරට: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා බිම සහ පීපී කො. 479හි කැබලි අංක 10 සහ 03; නැගෙනහිරට: මෙහි කැබලි අංක 03, පීපී කො. 479 හි කැබලි අංක 14, 15, සහ 17, කැබලි අංක 4 සහ රණවීර මාවත; දකුණට: රණවීර මාවත; බටහිරට: රණවීර මාවත, පීපී කො 6276 හි කැබලි අංක 10 සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා බිම.

03. **කැබලි අංක 06 – අම්පිට්ටනිය, කොම්පන්ජිරවෙල සහ අඹගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1073ක් පමණ**
උතුරට: ඇළ; නැගෙනහිරට: ගෝතමී මාවත සහ රණවීර මාවත; දකුණට: රණවීර මාවත; බටහිරට: රණවීර මාවත, කැබලි අංක 05 සහ ඇළ.

09 – 385

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.